# නීතිය දන්න කවුරුත් මේකට හොර උපාධි කඩයක් කියන්නේ නැහැ. හේතුව මේක නීතිගත ආයතනයක්



**හුස්නි හුසේන්**
ලේඛකාධිකාරි - SAITM

**අපිට උපාධි ප්‍රදානය කිරීමේ අවසර පත්‍රය ලැබුණා. එම තත්ත්වය ලැබුණායින් පසුව ගැසට් පත්‍රයක් මගින් අපට කිව්වා අප ප්‍රදානය කළ යුත්තේ Bachelor of Medicine and Bachelor of Surgery (MBBS) උපාධිය බව. අපි දැන් පිරිනමන්නේ ඒ උපාධිය තමයි.**




**වෛද්‍ය විද්‍යාව හදාරනු ලබන සිසුවෙකුට විද්‍යා විෂය ධාරාවෙන් උසස් පෙළ හදාරා අවම වශයෙන් C සාමාර්ථ දෙකක් හා S සාමාර්ථයක් තිබිය යුතු බවට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිර්නායනයක් බවට පත්ව තිබෙනවා. එම නිර්නායනයන් ඔබ ආයතනයේ කිසියම් ආකාරයකට අනුගමනය කරනු ලබනවාද?**

C සාමාර්ථ දෙකක් හා S සාමාර්ථයක් තිබිය යුතු බව කියා ඒගොල්ලෝ කියන්නේ විදෙස් රටවල ඉන්න වෛද්‍ය පීඨවල ළමයින්ට තිබිය යුතුයි. ඒක ලංකාවේ වෛද්‍ය පීඨවල තිබෙන සුදුසුකම නොවෙයි. ඒ වුනත් ඒගොල්ලෝ ඒ නීතිය ගෙනාවේ 2012 අගෝස්තුවල. අපිත් ඊට පස්සේ C සාමාර්ථ දෙකක් හා S සාමාර්ථයක් තිබෙන සිසුන් තමයි ලියාපදිංචි කරලා තියෙන්නේ.

**වෛද්‍ය පීඨයේ වෛද්‍ය උපාධියෙන් අධ්‍යයන කටයුතු නිමා කිරීමෙන් පසු සිසුවෙකුට ලැබෙන උපාධිය හඳුන්වන්නේ කෙසේද? එසේම එම පාඨමාලාව නිමා කිරීම සඳහා කොපමණ මුදලක් සිසුවකු විසින් ඔබ ආයතනයට ගෙවිය යුතුද?**

අපිට උපාධි ප්‍රදානය කිරීමේ අවසර පත්‍රය ලැබුණා. එම තත්ත්වය ලැබුණායින් පසුව ගැසට් පත්‍රයක් මගින් අපට කිව්වා අප ප්‍රදානය කළ යුත්තේ **Bachelor of Medicine and Bachelor of Surgery (MBBS)** උපාධිය බව. අපි දැන් පිරිනමන්නේ ඒ උපාධිය තමයි. අපි පටන් ගන්නකොට අපි **MD (Doctor of Medicine)** උපාධියෙන් පටන් ගත්තේ. ඒ දවස්වල ඒක රු. මිලියන 5.5කට පටන් ගත්තේ. දැන් වෙනකොට ඒ සඳහා රු. මිලියන 9.4ක් අය කරනවා.

**ඔබ ආයතනය හොර උපාධි කඩයක් බවත් එය වසා දැමිය යුතු බවත් චෝදනා කරමින් වෛද්‍ය සංගම්, ශිෂ්‍ය සංගම් හා සිවිල් සංවිධාන කියා සිටිනවා. එම චෝදනාවන් සහ විරෝධතාවයන් පිළිබඳව ඔබට කිව හැක්කේ කුමක්ද?**

නීතිය දන්නවා නම් කවුරුත් මේකට හොර උපාධි කඩයක් කියන්නේ නැහැ. හේතුව මේක නීතිගත ආයතනයක්. ඒ හින්දා මේක ආයෝජන මණ්ඩලයේ (BOI) ව්‍යාපෘතියක්. මේකට 2008 මාර්තු මාසේ BOI අනුමැතිය ලැබුණේ. ඉන්පසු BOI එකේ අපි ලියාපදිංචි වුනා 2008 ඔක්තෝබර්වල. 2009දී අපි Nizhny Novogorod State Medical Academy ආයතනයත් සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කළා. ඉන්පසුව BOI එක කිව්වා ඔයගොල්ලෝ දැන් අවශ්‍ය කොන්දේසි ලබාගෙන තිබෙන නිසා ඔයගොල්ලන්ට දැන් වැඩකටයුතු ආරම්භ කරන්න පුළුවන් කියලා. ඒ අනුව 2009 සැප්තැම්බර් මාසයේ අපි පළමුවන ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගත්තා. ඊටපස්සේ මේක එහෙම කරගෙන යනකොට වෛද්‍ය සභාවට කතා කළා. හේතුව, අපි දන්නවා මේ වෛද්‍ය උපාධිය ලබාගත්තාම ඊටපස්සේ මෙහේ ළමයින්ට වෘත්තීය කටයුතු කරන්න වෙනවා. එසේ පුහුණුවෙන්න නම් ඔක්කෝටම ඉස්සෙල්ලා සීමාවාසික පුහුණුව ලබාගන්න ඕනේ. ඒ පුහුණුව ලබන්න නම් අපි පිළිගත් ආයතනයක් වෙන්න ඕනේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ. එතකොට එතැන්ට ගිහිල්ලා කතා කරනකොට තමයි ඒගොල්ලෝ කිව්වේ ඒගොල්ලෝ දැනට සායනික පුහුණුව කොටසක් ලංකාවේ කරන එකයි කොටසක් වෙන රටක කරන එකයි පිළිගන්නේ නැහැ කියලා. ඒ හින්දා එවකට සිටි වෛද්‍ය සභාවේ සභාපති මහාචාර්ය ලලිතා මැන්දිස් මහත්මිය කිව්වා ඒ වගේම ඇය ලිඛිතව දැනුම්දීලා තියෙනවා අප ආයතනය ඉදිරියටත් පවත්වාගෙන යන්න ඕනේ නම් තියෙන එකම පිළියම Degree Awarding Institute එකක් වෙන්න කියලා.

**ඒ අනුව අපි ගියා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට. ඒ සඳහා ඉල්ලීමක් කරලා, දීර්ඝ වශයෙන් කටයුතු කරගෙන ගියා. ඒ කියන්නේ ඒගොල්ලෝ අපෙන් වාර්තාවක් අරගෙන ඒක විමසා බලා ඒ අනුව තමයි 2011 අගෝස්තු මාසයේදී අප ආයතනයට උපාධි ප්‍රදාන තත්ත්වය (Degree Awarding Status) ලැබුණේ. ඒ හින්දා කවුරුවත් කියනවානම් මේක හොර උපාධි කඩයක් කියලා, මේක උත්තරීතර පාර්ලිමේන්තුවෙන් තමයි ගැසට් කරලා තියෙන්නේ. රටේ නීතියක් තියෙනවානම් මේක විහිළුවක් කියලා හිතාගෙනද හොර උපාධි කඩයක් කියලා කියන්නේ.**

සාකච්ඡා කළේ :
**මාධ්‍යවේදී ලෝරන්ස් ෆර්ඩිනැන්ඩු**

## අප විරුද්ධ වන්නේ ලාභය පුද්ගලයකුට හෝ කණ්ඩායමක් වෙත යාම ගැනයි

අධ්‍යාපනය තිබිය යුත්තේ පුද්ගලයකුට හෝ කණ්ඩායමකට ලාභ ලැබීමට නොව සේවයක් වශයෙනි. උදාහරණයක් වශයෙන් ලංකාව තුළ ක්‍රිස්තියානි පාසල් තිබෙන බව අපි දනිමු. එම පාසල් බිහිකර ඇති අරමුණ ලාභ ලැබීමට නොව සේවයක් කිරීම සඳහා වේ. එම පාසල්වලින් ලැබෙන ආදායම ලාභ ලැබීමේ චේතනාවකින් පුද්ගලයකුට හෝ කණ්ඩායමකට යොමු නොවන අතර යොමුවන්නේ එම පාසල් අරමුදල වෙතය. පාසලේ දියුණුව පිණිසය. ඒ හරහා නැවතත් ළමුන්ගේ සුභසිද්ධිය පිණිසය. ඒ අනුව අප විරුද්ධ වන්නේ අධ්‍යාපනය පෞද්ගලිකකරණය කිරීමෙන් පුද්ගලයකුට හෝ කණ්ඩායමකට තම ලාභය පිණිස කටයුතු සම්පාදනය වීම ගැනවේ.

**- රැල්ස්ටන් වයිමන්**



ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය විසින් අංක 510, රාජගිරිය පාර, රාජගිරියේ පිහිටි K.S.U. ග්‍රැෆික් පෞද්ගලික සමාගමේ මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදි.

# අවධානයට

ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, නො. 368/6, බෞද්ධාලෝක මාවත, කොළඹ 07

1914 - 2014



# SAITM ආයතනය දෙන උපාධිය ප්‍රමාණවත් නැහැ වෛද්‍යවරයෙකු වශයෙන් කටයුතු කරන්න

2015 ජූලි මාසයේ ඉහළ පෙළේ දස දෙනෙකුගෙන් සමන්විත විශේෂඥ වෛද්‍ය කණ්ඩායමක් ෂඹඑ ආයතනයට යවලා එහි කටයුතු පිළිබඳව පරීක්ෂණයක් පවත්වලා ඔවුන් විසින් වාර්තාවක් ලබා දුන්නා. ඒ වාර්තාව පදනම් කරගෙන වෛද්‍ය සභාව ඒකමතිකව තීරණය කළා එතැන දෙන උපාධිය ප්‍රමාණවත් නැහැ වෛද්‍යවරයෙකු වශයෙන් කටයුතු කරන්න කියලා.

එතැනින් උපාධිය ලබාගන්නා අය සුදුසු නැහැ කියලා සෞඛ්‍ය ඇමතිතුමාහට දැනුම් දුන්නේ 2015 සැප්තැම්බර් 4 වැනිදා. ඉතින් අපි ඒක වේලාසනම දැනුම් දීලා තියෙන්නේ. එතැනින් උපාධියක් අරන් ආවාම ලියාපදිංචි කරන්න නම් අපට බැහැ. අධිකරණය කියනවානම් අපට කරන්න කියලා අපි ඒක කරන්නෙත් නැහැ.

ඒ ඉන්න රෝගීන් විවිධාකාර විශාල පරාසයක විවිධාකාර ලෙඩරෝග තියෙන පිරිසක් වෙන්නත් ඕනේ. විශේෂයෙන්ම හදිසි අනතුරු, ඒ වගේම ප්‍රශව වේදය, අධිකරණ වෛද්‍ය විද්‍යාව, මානසික රෝග හා ප්‍රජා වෛද්‍ය විද්‍යාව වැනි දේ. ඒ හැම පරාසයකටම විසිරුණු රෝගීන් එන්න ඕනේ. එහි රෝහලක් තිබුණාට ඒ කියන ලද නිර්නායන සම්පූර්ණ කරන්නේ නැති නිසා වෛද්‍යවරු පුහුණු කරන්න බැහැ කියලා තමයි අපේ විශේෂඥ කණ්ඩායමේ මතය වුණේ.



මහාචාර්ය කාලෝ ෆොන්සේකා
සභාපති
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

**ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපනය පෞද්ගලිකරණය කිරීම පිළිබඳව ඔබගේ ස්ථාවරය කුමක්ද?**

ඒක ඉතාම පුළුල් ප්‍රශ්නයක්. දැනටමත් අධ්‍යාපනය බොහෝදුරට පෞද්ගලිකරණය වෙලා. මේ දක්වා ඒක නිල වශයෙන් වෛද්‍ය ක්ෂේත්‍රයේ වෙලා නැහැ, නමුත් ඒ අතට යොමුවෙලා තියෙනවා. ඒක තමයි සත්‍ය සහ යථාර්ථවාදී තත්ත්වය. ඔබතුමා මගෙන් අහනවානම් මගේ අදහස කුමක්ද අධ්‍යාපනය පෞද්ගලිකරණය විය යුතුද නැද්ද කියලා මට ඒකට දූඩිව සියලු ක්ෂේත්‍ර ගැන සලකා බැලුවහොත් විරුද්ධවෙන්න බැහැ. මොදක මගේ දුව ගියේ පෞද්ගලික ආයතනයකට, ඒක හුඟාක්කල් වෙච්ච දෙයක්. එතකොට කිසිසේත් මේ රටේ අධ්‍යාපනය පෞද්ගලිකරණය නොවිය යුතුයි කියන ස්ථාවරය මම දරන්නේ නැහැ.

**ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ආරම්භ කිරීම හා ඒවා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිර්නායන් මොනවාද?**

නිල වශයෙන් ප්‍රමිතියට අනුකූලව වෛද්‍ය විද්‍යාව උග න්වනවානම් ඒක අපිට නිල වශයෙන් විරුද්ධවෙන්න හැකියාවක් නැහැ. මොකද, රජයේ ප්‍රතිපත්තියට අපි අනුකූලවෙන්න ඕනේ නිසා. රජයේ ස්ථාවරය එහෙම පෞද්ගලික ක්ෂේත්‍රයට අධ්‍යාපනයේ තැනක් ලැබුණාම, මිශ්‍ර ආර්ථිකය කමක් නැහැ. ඒකට වෛද්‍ය සභාව රජයේ ආයතනයක් වන බැවින් ඒකට අපි අනුකූලවෙන්න ඕනේ.

පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් පවත්වාගෙන යාමේදී කාරණා දෙකක් ප්‍රමුඛයි. එක, මූලික අධ්‍යාපන සුදුසුකම් තියෙන්න ඕනේ ඒ වෛද්‍ය විද්‍යාලයට එන අයට. මූලික අධ්‍යාපන සුදුසුකම් ලෙසට මේ වන විට වෛද්‍ය සභාවේ ප්‍රකාශිත මතය වෙලා තියෙන්නේ අ.පො.ස. උසස් පෙළ විද්‍යා ධාරාවෙන් යටත් පිරිසෙන් C දෙකක් හා S එකක් තියෙන්න ඕනේ. එම

විෂයයන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා ජීව විද්‍යාව විය යුතුයි. දෙක, ඒවා සපිරිහෙලා තියෙනවානම් වෛද්‍ය ආයතනයට යොමු වුණාට ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒ වෛද්‍ය අධ්‍යාපනය දෙන ආයතනයට යම්කිසි ප්‍රමිතියකට අනුකූලවෙන්න ඕනේ කියලා Medical Ordinance පොතේම කියලා තියෙනවා. ඒ අනුව ඒ ප්‍රමිතියට අනුකූලවම වෙන්න ඕනේ. ඒ වගේම ප්‍රායෝගික වශයෙන් උපයෝගි කරගන්නා නිර්නායන් කීපයක්ද තියෙනවා.

**මාලබේ SAITM ආයතනයට අනුබද්ධව වෛද්‍ය පීඨයක් පවත්වාගෙන යනු ලබනවා. එම වෛද්‍ය පීඨය සම්බන්ධයෙන් වෛද්‍ය සභාවේ විග්‍රහය කුමක්ද?**

2015 ජූලි මාසයේ ඉහළ පෙළේ දස දෙනෙකුගෙන් සමන්විත විශේෂඥ වෛද්‍ය කණ්ඩායමක් SAITM ආයතනයට යවලා එහි කටයුතු පිළිබඳව පරීක්ෂණයක් පවත්වලා ඔවුන් විසින් වාර්තාවක් ලබා දුන්නා. ඒ වාර්තාව පදනම් කරගෙන වෛද්‍ය සභාව ඒකමතිකව තීරණය කළා එතැන දෙන උපාධිය ප්‍රමාණවත් නැහැ වෛද්‍යවරයෙකු වශයෙන් කටයුතු කරන්න කියලා. ප්‍රධාන කරුණු තුනක් ගැන අවධානය යොමු වුණා. එම අඩුපාඩුකම් පිළිබඳව අප වෛද්‍ය සභාව විසින් 2015.11.16 වැනි දින විශේෂ නිල නිවේදනයක් නිකුත්කොට එය මහජනයාගේ අවධානය සඳහා පුවත්පත්වල පළකරනු ලැබුවා. එම කණ්ඩායමේ වාර්තාවට අනුව දැකගතහැකි ප්‍රධාන දේ තමයි එම රෝහලේ අවශ්‍ය ප්‍රමාණයට ලෙඩ්ඩු නැහැ වෛද්‍ය සිසුන්ට ඉගෙන ගන්න, ඒක තමයි ප්‍රධාන ඌනතාව. විවිධ වර්ගවල ලෙඩ්ඩු නැහැ. එතැනට විවිධ වර්ගවල ලෙඩ්ඩු එන්නේ නැහැ එතැන ගෙවන තැනක් නිසා. එතකොට රජයේ වෛද්‍ය විද්‍යාලවල, රජයේ රෝහල්වලට බොහෝ පිරිසක් එනවානේ. ඒකනේ අපගේ වෛද්‍යවරුන්ගේ සායනික පුහුණුව ඉතා ඉහළ මට්ටමක තියෙන්නේ. ඒ නිසයි ලෝකයේ ඕනෑ තැනක අපේ වෛද්‍යවරු පිළිගන්නේ.

වෛද්‍යවරුන් වශයෙන් පුහුණු කිරීමේදී ඒක වසර 5ක පුහුණුවක්. ඒ පුහුණුවේදී වසර තුනකටත් වඩා අධික කාලයක් සායනික පුහුණුව කියන එක ලබාදෙන්න ඒකට ගැලපෙන රෝහලක් තියෙන්න ඕන. රෝහලක් තිබීම පමණක් ප්‍රමාණවත් නැහැ ඒ රෝහලට ප්‍රමාණවත් රෝගීන් ඉන්න ඕනෑ. ප්‍රමාණවත් රෝගීන් සිටීම පමණක් මදි, ඒ ඉන්න රෝගීන් විවිධාකාර විශාල පරාසයක විවිධාකාර ලෙඩරෝග තියෙන පිරිසක් වෙන්නත් ඕනේ. විශේෂයෙන්ම හදිසි අනතුරු, ඒ වගේම ප්‍රශව වේදය, අධිකරණ වෛද්‍ය විද්‍යාව, මානසික රෝග හා ප්‍රජා වෛද්‍ය විද්‍යාව වැනි දේ. ඒ හැම පරාසයකටම විසිරුණු රෝගීන් එන්න ඕනේ. එහි රෝහලක් තිබුණාට ඒ කියන ලද නිර්නායන සම්පූර්ණ කරන්නේ නැති නිසා වෛද්‍යවරු පුහුණු කරන්න බැහැ කියලා තමයි අපේ විශේෂඥ කණ්ඩායමේ මතය වුණේ.

**මේ වන විට එහි අධ්‍යාපන කටයුතු අවසන් කළ සිසුන්ට වෛද්‍ය සභාවේ ලියාපදිංචිය නොදෙන තත්ත්වයක් වාර්තා වෙනවා. ඒ පිළිබඳව පැහැදිළි කළහොත්?**

ඒ වාර්තාව නිවැරදියි. ඒ අය සුදුසු නැහැ. එතැනින් උපාධිය ලබාගන්නා අය සුදුසු නැහැ කියලා සෞඛ්‍ය ඇමතිතුමාහට දැනුම් දුන්නේ 2015 සැප්තැම්බර් 4 වැනිදා. ඉතින් අපි ඒක වෙලාසනම දැනුම් දීලා තියෙන්නේ. එතැනින් උපාධියක් අරන් ආවාම ලියාපදිංචි කරන්න නම් අපට බැහැ. අධිකරණය කියනවානම් අපට කරන්න කියලා අපි ඒක කරන්නෙත් නැහැ. මම මෙතැන ඉන්නකම් මම ඒක කරන්නේ නැහැ.

**විවිධ ආයතනික රාමුවක් තියෙන රාජ්‍ය විශ්ව විද්‍යාල තුළ පවා මෙවැනි නිර්නායන අවභාවිතා කිරීමක් දක්නට ලැබෙනවා. එතකොට සම්පූර්ණ වෙළඳ න්‍යායන් ක්‍රියාත්මක වෙන ඒවා තුළ ඒවායේ නිර්නායන අවභාවිතා වීම ගැන කවර කතාද කියලා තමයි කියන්න තියෙන්නේ. ඔය තත්ත්වය තිබුණා වුනාට ඕවායින් කිසිම සහතිකයක් ලැබෙන්නේ නැහැ ඒවා නියාමනයන් ඇතුලේ සහ ඒ වෙළඳපොල මූලධර්මවලට පිටින්, ඉල්ලුම-සැපයුම තරඟයට පිටින් වූ නිර්නායනයන් මත ඒ ගුණාත්මකභාවය තීරණය වෙනවා කියන්න කිසිම සහතිකයක් ලැබෙන්නේ නැහැ.**

**මෙතැන තියෙන විශේෂ තත්ත්වය තුළ මම හිතන්නේ වෛද්‍ය සභාවේ මැදිහත්වීම යම්කිසි අර්ථයක් තියෙනවා. මේක හරි අනතුරුදායක තත්ත්වයක්. මේ තත්ත්වයට ඉඩ දුන්නොත් එහෙම හතු පිපෙන්නා වාගේ එන්න ගන්නවා, අපි දන්නවානේ ටියුෂන් පන්තිවලට වෙලා තියෙන දේවල්. ඔය රෝහල් කිසිම ගුණාත්මකභාවයක් නැති, ඉන්දියාවේත් මේ තත්ත්වය වෙලා තියෙනවා. ඒක නිසා දැනට තියෙන තත්ත්වය තුළ වෛද්‍ය සභාවේ තියෙන ස්ථාවරය නිසා තමයි යම්කිදි විදිහකට මේ තත්ත්වය පාලනයකට ලක්වෙලා තියෙන්නේ. මම ඒක ඒ විදිහට තමයි බලන්නේ.**

# වෛද්‍ය සභාවේ තියෙන ස්ථාවරය නිසා තමයි යම් විදිහකට මේ තත්ත්වය පාලනය වෙලා තියෙන්නේ



**ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි**
**හිටපු සභාපති**
**විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය**

**මෑත කාලයේ සිට මාලබේ පිහිටි සයිටම් ආයතනය උපාධි කඩයක් බවට චෝදනා කරමින් එය වසා දමන ලෙසට රජයට බලකරන දැවැන්ත විරෝධතාවයක් ශිෂ්‍ය සංගම්, වෛද්‍ය සංගම්, දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන සහ විද්වතුන්ගේ දායකත්වයෙන් සිදුවෙනවා. සයිටම් ආයතනය උපාධි කඩයක් බවට කරන චෝදනාව පිළිබඳව ඔබගේ විග්‍රහය කුමක්ද?**

මේ ආයතනය මූලික වශයෙන් ලාභ උපයන චේතනාවෙන් තියෙන්නේ. ලාභ ලැබීම සඳහා ව්‍යාපාරික අරමුණක් මත කෙරෙන දේවල්, ව්‍යාපාරික අරමුණක් මත කරනකොට එතැන තියෙන්නේ ව්‍යාපාරික ගනුදෙනුවක්. මේවාට එන අය යම් විශාල මුදලක් වියදම් කරලා එනම් මිලියන 20ක් විතර වියදම් කරලා වෛද්‍ය උපාධියක් ගන්න එනවා. ඒ ආයතනයේ මූලික නැඹුරුව වන්නේ මොකක්ද? වැඩි ප්‍රමාණයක් තමන් වෙත නැඹුරුකර ගැනීමයි. උපාධියේ ගුණාත්මකභාවය කියන එක නොවෙයි වෙන්නේ. වෙළඳපොල තරඟයක් තුළ මේ වගේ උපාධියක් පිරිනමනකොට ඒ උපාධියේ ගුණාත්මකභාවය තීරණය වෙනවා අර ඉල්ලුම්කරුවාට අවශ්‍ය මොනවාද? ඉල්ලුම්කරුවාට අවශ්‍ය වන්නේ කුමක්ද? අඩුම මුදලට වෛද්‍ය උපාධි සහතිකය, එච්චරයි අවශ්‍යය. මේකට මම නිතර පාවිච්චි කරන උදාහරණයක් තමයි, අපි යනවා මෝටර් රථ දෙපාර්තමේන්තුවට ඩ්‍රයිවින් ලයිසන් එකක් ගන්න. ඒ ආයතනය හොඳට පිරිහිච්ච ආයතනයක්. දැන් සම්පූර්ණයෙන් අල්ලස් දූෂණයට ලක්වෙලා කියලා

හැමෝම දන්නවා. මේ නිසා අපි දන්නවා මෙතැනින් ලයිසන් එක ගන්න අති බහුතරයකට වාහන එලවන්න බැහැයි කියලා. ඊළඟ කාරණය එහි පරීක්ෂකවරු සහ රියදුරු පුහුණුව ලබාදෙන්නන් අතර පොඩි ගනුදෙනුවක් තියෙනවා. ඒ ගනුදෙනුව හරහා වාහනය පොඩ්ඩක් එහාට මෙහාට කරකවන්න කියලා මාව පාස් කරනවා. ඇත්ත වශයෙන්ම මටත් ඕන කරනවා, මං පස්සේ ඉගෙන ගන්නවා ඩ්‍රයිවින් කරන්නේ කොහොමද කියලා, දැනට ඕන ලයිසන් එක. එතකොට මට ලයිසන් එකක් තියෙනවා. මගේ අවශ්‍යතාවය මොකක්ද? පාරිභෝගිකයෙකු විදිහට මගේ ඉල්ලුම තියෙන්නේ ලයිසන් එකටනේ, මගේ රිය පැදවීමේ හැකියාවට නොවෙයිනේ. මේ වගේ තත්ත්වයක් තමයි සයිටම් වගේ ආයතන හරහා සිද්ධවෙන්නේ. මට අවශ්‍ය වෛද්‍ය උපාධිය මිසක් ඒකේ ගුණාත්මක භාවය නොවෙයි. මට පුළුවන් ඒ පැත්ත පළාතේ යන්නේ නැතිව වෛද්‍ය උපාධිය දෙනවානම් මම ඒත් කැමැති වෙනවා. මොකද සමහරක් අයට උවමනාව තියෙන්නේ ප්‍රැක්ටිස් කරන්නත් නොවෙයිනේ. ප්‍රැක්ටිස් කරන කෙනෙකුට මොනවාහරි දැනගන්න ඕනෑනේ. සමහරුන්ට ඕනෑ නිකන් MBBS එකක් තියෙනවා ඒ වගේ මේකට තියෙනවා හොඳ සමාජ ගරුත්වයක්. එතකොට මේ නිසා ඒ ඉල්ලුම-සැපයුම න්‍යාය තුළ මේකේ ගුණාත්මකභාවය සහතික කිරීමක් වෙන්නේ නැහැ. මෙන්න මේක තමයි සයිටම් වගේ ආයතනයක වෙන්නේ. සයිටම් වගේ ආයතනයක් බැලුවහම ඒකේ ශික්ෂණ රෝහල් ප්‍රශ්නය ගත්තාම ඒ සියල්ලෙන්ම පෙනෙන දෙයක් තමයි ඒ බාහිර න්‍යායාමනයක් නැත්නම් එතැන ගුණාත්මකභාවය සහතික වෙන්නේ නැහැ. මේ වගේ එකක බාහිර නියාමනයක් ක්‍රියාත්මක කරන්න බැහැ. අපේ තියෙන දේශපාලන ක්‍රමය ඇතුලේ අපි දන්නවා රාජ්‍ය විශ්ව විද්‍යාව තුළ වුනත් මේ තත්ත්වය අවභාවිතයෙන් සිද්ධවෙනවා කියලා. අර වගේ ඒවාවල අවභාවිතය පේන්න තියෙන ඉඩකඩ ඉතා වැඩියි. මෙතැන සනාතන සභාව වැනි දේවල් තියෙනවා. ඒ සබාව තුළ විවිධ අය ඉන්නවා. විවිධ පීඨවල අය, විවිධ දේශපාලන මත දරන අය ඉන්න නිසා අඩුම තරමින් පුළුවන් පෙන්වන්න අඩුපාඩුකම්. මම පුද්ගලිකව දන්නවා මමත් සනාතන සභාවල පීඨවල ඉන්න නිසා, ඒ කියන්නේ යම්කිසි දෙපාර්තමේන්වක පාඨමාලාවක් කියලා පාඨමාලාවක් පවත්වාගෙන යනවානම් ඒ දෙපාර්තමේන්තුවට තියෙනවා ලාභ අපේක්ෂාවක්. නමුත් අනෙක් දෙපාර්තමේන්තුවට ඒක නැහැනේ. අනෙක් අධ්‍යයන අංශවලට, පීඨවල අයට සනාතන සභාවට එන්න එහෙම නැහැ, ඒගොල්ලන්ට පුළුවන් මේක බලලා අරගොල්ලන්ගේ අවශ්‍යතාවය පරීක්ෂාවන විදිහට සංවරණ හා තුළන ක්‍රමයක් එතැන හැදෙනවා. නමුත් ඒ වගේ එකක් සයිටම් වගේ ආයතනවල නැහැ. ඒ ආයතනවල ව්‍යාපාරික අරමුණු තිබෙන පිරිසක් හරහා තමයි තීරණය ගන්නේ. එගොල්ලන්ට පුළුවන් මෙතැන නිර්නායන තිබුණත් ඒ නිර්නායනවලට, ඇස්වලට වැලිගහලා තමන්ගේ ව්‍යාපාරික අරමුණු මත ඒ ක්‍රියාවලියට යන්නේ.

**ඔබ එසේ කියා සිටියත් සයිටම් ආයතනය උපාධි ප්‍රදාන ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී තිබෙනවා. ඒ වගේම එම සභාව විසින් පත් කරන ලද විශේෂ බලධාරියකු ඔවුන්ගේ වැඩ අධීක්ෂණය කිරීම සඳහා ඔවුන්ට ඉන්නවා. මෑත කාලයක සිට එම වගකීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා යටතට පත්වුනා. ඔහු යටතේ එම අධීක්ෂණය සිදුවිය යුතු බව කියැවෙනවා. එවැනි පසුබිමක් ඔවුන්ට තිබෙනවා. ඒ ගැන යමක් පැවසුවහොත්?**

විශේෂ නිලධාරියා පත්වීම තුළම ඕකට උත්තරය තියෙනවා. පනතේ තියෙනවා උපාධි පිරිනමන ආයතනයක් සම්බන්ධයෙන් නිසි බලධාරියෙක් පත්කරනවා කියලා. නිසි බලධාරියා පත්කරන්නේ නැතිව ඉඳලා ඉඳලා මොකද කළේ? උසස් අධ්‍යාපන අමාත්‍යවරයාව සිටි එස්. බී. දිසානායක මහතා සිටි කාලයේ ඔහුගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා කියන්නෙත් දේශපාලන පත්වීමක්. මගෙත් හොඳ මිත්‍රයෙක් සුනිල් ජයන්ත නවරත්න මහත්තයා. ඔහුව පත්කළා නිසි බලධාරියා විදිහට. එම පත්වීම කළේම මතභේදකාරී තත්ත්වයක් තුළ. ඒකෙන්ම අපිට පේනවා කොයිතරම් දුරට මේවා අවභාවිතා කරනවාද කියලා. ඊටපස්සේ ඒක වෙන්නේ ප්‍රතිපාදන කොමිෂම, ශාස්ත්‍රීය ප්‍රජාව, මෙය හරහා නොවෙයි ගුණාත්මකභාවය තීරණය වෙන්නේ. ඊටපස්සේ ඒ නිර්නායන වුනත් අපි දන්නවා මං අර කියපු විදිහේ විවිධ ආයතනික රාමුවක් තියෙන රාජ්‍ය විශ්ව විද්‍යාල තුළ පවා මෙවැනි නිර්නායන අවභාවිතා කිරීමක් දක්නට ලැබෙනවා. එතකොට සම්පූර්ණ වෙළඳ න්‍යායන් ක්‍රියාත්මක වෙන ඒවා තුළ ඒවායේ නිර්නායන අවභාවිතා වීම ගැන කවර කතාද කියලා තමයි කියන්න තියෙන්නේ. ඔය තත්ත්වය තිබුණා වුනාට ඕවායින් කිසිම සහතිකයක් ලැබෙන්නේ නැහැ ඒවා නියාමනයන් ඇතුලේ සහ ඒ වෙළඳපොළ මූලධර්මවලට පිටින්, ඉල්ලුම-සැපයුම තරගයට පිටින් වූ නිර්නායනයන් මත ඒ ගුණාත්මකභාවය තීරණය වෙනවා කියන්න කිසිම සහතිකයක් ලැබෙන්නේ නැහැ.

**සයිටම් ආයතනයේ වෛද්‍ය උපාධිය සමත් වූවන්ට වෛද්‍ය වෘත්තිකයන් ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීම අවශ්‍ය කෙරෙනවා. එනමුත් එම සිසුන් ලියාපදිංචි කිරීම එම ආයතනය ප්‍රතික්ෂේප කර තිබෙනවා. එය යුක්තිසහගත යැයි කියා ඔබ තීරණය කරනවාද?**

මේක විවෘතව ගත්තොත් කෙනෙකුට මේක ප්‍රශ්න කරන්න පුළුවන්. පිටරටින් එන වෛද්‍ය සිසුන්ට මෙහේ විභාග යක් තියලා ඒකෙන්නේ තෝරාගන්නේ, එහෙමනම් ඇයි මේකට විතරක් මේ ප්‍රශ්නය කියලා. නමුත් විශේෂිත තත්ත්වය ගත්තාම අපට තියෙන ප්‍රශ්නයක් තමයි ඒගොල්ලෝ කියන්නේ අඩු තරමින් මේකේ මූලික නිර්නායනයන්වත් නැතුව මේගොල්ලෝ ශික්ෂණ රෝහල් පිළිබඳ ප්‍රශ්නය, ඒවාත් නැතුව කොහොමද දෙන්නේ කියලා, මං හිතන්නේ ඒක සාධාරණ තත්ත්වයක්. සාමාන්‍ය කෙනෙකුට මෙහෙමත් තර්ක කරන්න පුළුවන්, උපාධියක් කියන්නේ වෘත්තීය සුදුසුකමක් නේද? නීති උපාධියක් තිබුණාට උසාවි යන්න බැහැනේ. කොළඹ විශ්ව විද්‍යාලයේ නීති උපාධිය ගත් කෙනෙකුට උසාවියේ පෙනී සිටින්න බැහැ. ඒකට නීති විද්‍යාලයේදී පවත්වන විභාගයක් මගින් සුදුසුකම් ලබන්න ඕන. වෛද්‍ය උපාධියක් කියන්නේ title එකක්. ඒකේ වෘත්තීය සුදුසුකම් ලබන්න් මූලික වශයෙන් වෛද්‍ය සභාවේ විභාගය ලියන්න ඕනේ. ඒ නිසා අරකට මැදිහත් වෙන්න අයිතියක් නැහැ කියලා කියන්න පුළුවන් මූලධර්මීය වශයෙන්. නමුත් මෙතැන තියෙන විශේෂ තත්ත්වය තුළ මම හිතන්නේ වෛද්‍ය සභාවේ මැදිහත්වීම යම්කිසි අර්ථයක් තියෙනවා. මේක හරි අනතුරුදායක තත්ත්වයක්. මේ තත්ත්වයට ඉඩ දුන්නොත් එහෙම හතු පිපෙන්නා වාගේ එන්න ගන්නවා, අපි දන්නවානේ ටියුෂන් පන්තිවලට වෙලා තියෙන දේවල්. ඔය රෝහල් කිසිම ගුණාත්මකභාවයක් නැති, ඉන්දියාවේත් මේ තත්ත්වය වෙලා තියෙනවා. ඒක නිසා දැනට තියෙන තත්ත්වය තුළ වෛද්‍ය සභාවේ තියෙන ස්ථාවරය නිසා තමයි යම්කිදි විදිහකට මේ තත්ත්වය පාලනයකට ලක්වෙලා තියෙන්නේ. මම ඒක ඒ විදිහට තමයි බලන්නේ.

**කොතලාවල ආරක්ෂක පීඨයේ {Kotalawala Defence Academy (KDA)} වෛද්‍ය පීඨයක් තියෙනවා. එහි සිසුන්ට තිබෙන අඩුපාඩුකම් හෝ පහසුකම් ගැන සයිටම් ආයතනයට එරෙහිව චෝදනා නඟන බොහෝ සංවිධාන දැඩි විරෝධතාවයක් දක්වන තත්ත්වයක් පෙනෙන්නට නැහැ. ඒ ගැන ඔබගේ අදහස කුමක්ද?**

මම හිතන්නේ ඒ ප්‍රශ්නයත් අදාළව මතු කළ යුතුයි කියලා. මම නම් ඕක හැමදාමත් කියන දෙයක්. සයිටම් ප්‍රශ්නය විතරක් නොවෙයි KDA වෛද්‍ය උපාධිය සම්බන්ධයෙනුත් ඒ ප්‍රශ්න කළ යුතුයි.